සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක : 02 /2020

මගේ අංකය: PPSC/ES/11/F1/12/04
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
පළාත් සභා සංකීර්ණය,
නවනගරය, රත්නපුර.
2020.01.17

සබරගමුව පළාත් සභාවේ,

01.ප්‍රධාන ලේකම්,
02.ආණ්ඩුකාරවර ලේකම්,
03.සභා ලේකම්/සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
04.සියළුම පළාත් කොමසාරිස්වරුන් / පළාත් අධ්‍යක්ෂවරුන්,
05.දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
06.පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් වෙත,

## <u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ දරන ලද තනතුරු වලින් මුදා හැරීම සඳහා හෝ ඉල්ලා අස්වීම</u>

සබරගමුව පළාත් රාජ්‍ය සේවයට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන් වෙනත් තනතුරු සඳහා මුදාහැරීමේදී හෝ අදාල තනතුරෙන් ඉල්ලා අස්වීම් වලදී මෙම කොමිෂන් සභා කාර්යාලයට අදාල ලියවිලි ඉදිරිපත් කිරීමේදී දීර්ඝ කාලයක් ප්‍රමාද කර එම ලියවිලි ඉදිරිපත් කිරීම කෙරේ කොමිෂන් සභාවේ විශේෂ අවධානය යොමු වී ඇත.

02. එසේම මෙම කාර්යාලය විසින් මීට පෙර හඳුන්වා දී ඇති **<u>PPSC/ES/GEN/FO/17 හා 2016.04.29</u>** දිනැති මුදාහැරීම් ආකෘති පත්‍රය මුදාහැරීම අපේක්ෂා කරන නිලධාරියා/නිලධාරිනිය විසින් සම්පූර්ණ කර, තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයද සමඟ නිලමුද්‍රාව තබා ප්‍රධාන ලේකම් මඟින් කොමිෂන් සභාව වෙත එවීම අනිවාර්ය බවද අවධානයට යොමු කරනු කැමැත්තෙමි.

03. තවද ඉහත ආදර්ශ ආකෘති පත්‍රය ඡායා පිටපත් කර එවිය යුතු අතර, නැවත පරිගණක ගත කර සකස් කර එවන්නේ නම්, මෙහි සඳහන් සියළුම කරුණු අන්තර්ගත කර එවිය යුතු බව ( ආකෘති පත්‍රය අවසානයේ ඇති අංකයන්ද සමඟ ) අවධාරණය කරන අතරම, එසේ නොමැතිව අඩුපාඩු සහිතව ලැබෙන්නාවූ ආකෘති පත්‍ර නැවත ඔබ වෙත එවීමට සිදුවන බවත් වැඩිදුරටත් දන්වමි.

04. තවද ඉල්ලා අස්වීම් සඳහා එම ආකෘති පත්‍රය අවශ්‍ය නොවන අතර, ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිත නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය හා අදාල ඇමුණුම් ප්‍රධාන ලේකම් මඟින් එවිය යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

05. ඉහත කරුණු කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරන අතර, අදාල ලිපි ඉහත පරිදි කඩිනමින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කල යුතු අතර, මින් ඉදිරියට මුදාහැරීම් සම්බන්ධව කටයුතු කිරීම ප්‍රමාද වීම පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීමට සිදු වන බවද කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
ලේකම්,
පළාත්රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
පළාත් සභා සංකීර්ණය-රත්නපුර